2025 01 . 03 . ලංකාදීප . පිටුව 6

# ජන සංගණනය මාසයකින් ප්‍රමාදයි

■ නිමල කොතිතුවක්කු

**ජන හා නිවාස සංගණනයේ කටයුතු මාසයකින් පමණ ප්‍රමාද වන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය පැවසුවාය.**

සංගණන කටයුතු දෙසැම්බර් මස 23 වන දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණත් කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල ඇතැම් තොරතුරු ලබාගැනීමට නොහැකිවීම මත ඒ කටයුතු ප්‍රමාද වූ බවද අධ්‍යක්ෂ ජනරාල්වරිය සඳහන් කළාය.

ජන හා නිවාස සංගණනයේ කටයුතු සඳහා පැමිණෙන නිලධාරීන්ට ඇතැම් නිවාසවලින් තොරතුරු නොදීම මෙම ප්‍රමාදයට හේතු වූ බවත් සෙනෙවිරත්න මහත්මිය පැවසුවාය.

එම තොරතුරු මේ දිනවල ලබා ගනිමින් සිටින බවත් මෙහි අවසන් වාර්තාව මාසයක් ඇතුළත රජයට බාරදීමට කටයුතු කරන බවත් ඇය කීවාය. ජන හා නිවාස සංගණනයේ තොරතුරු රැස් කිරීම 2024 වසරේ ඔක්තෝබර් මාසයේ ආරම්භ විය. ඒ සඳහා දිවයිනපුරා නිලධාරීහු 35,000 ක් පමණ යොදවනු ලැබ සිටිති.